# අධ්‍යයන පොදු සහතික පත්‍ර
# (උසස් පෙළ)
# 12 සහ 13 ශ්‍රේණි

# බෞද්ධ ශිෂ්ටාචාරය
## විෂය නිර්දේශය

**(2017 සිට ක්‍රියාත්මක වේ)**

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
**www.nie.lk**

බෞද්ධ ශිෂ්ටාචාරය

12, 13 ශ්‍රේණි

විෂය නිර්දේශය

ප්‍රථම මුද්‍රණය 2017

C ජාතික අධ්‍යාපන ආයතනය

ISBN: ......................

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

# හැඳින්වීම

ජාතික අධ්‍යාපන ක්‍රියාවලියේ දී විෂයමාලාවට හිමිවන්නේ වැදගත් ස්ථානයකි. ජාතික අවශ්‍යතාවලට සරිලන අයුරින් විෂයමාලා සංශෝධනය කිරීම කාලීනව සිදුවන්නකි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ 6-11 ශ්‍රේණිවල සිසුන්ට 2015 වර්ෂයේ සිට හඳුන්වා දෙනු ලැබූ බුද්ධ ධර්මය නව විෂය නිර්දේශය ඉගෙනීම තුළින් බුදු සමයේ මූලික ඉගැන්වීම්, ශාසන ඉතිහාසය හා බෞද්ධ සංස්කෘතිය ආදී ක්ෂේත්‍ර පිළිබඳ නිපුණතා පාදක කරගනිමින් ප්‍රමාණාත්මකව, ගුණාත්මකව හා ප්‍රයෝජනවත්ව කරුණු අධ්‍යයනය කිරීමට අවස්ථාව සලසා දී ඇත.

ඒ අනුව අ.පො.ස. සාමාන්‍ය පෙළ කඩඉම පසුකර උසස් පෙළ බෞද්ධ ශිෂ්ටාචාරය විෂය අධ්‍යයනයට පිවිසෙන දරුවන්, බුද්ධ කාලීන භාරතීය ආගමික, සංස්කෘතික, සමාජ, ආර්ථික හා දේශපාලන පසුබිමට සාපේක්ෂව බෞද්ධ ඉගැන්වීම්වල අර්ථාන්විත බව ද, ත්‍රිවිධ රත්නය, බෞද්ධ ආචාර ධර්ම, ශාසන ඉතිහාසය, කලාශිල්ප, බෞද්ධ ආර්ථික හා දේශපාලන දර්ශනය, බෞද්ධ සංස්කෘතියේ ජාත්‍යන්තර ව්‍යාප්තිය ආදී ක්ෂේත්‍ර පිළිබඳ විස්තරාත්මක, විචාරාත්මක හා තුලනාත්මක ගවේෂණයකට මෙමගින් යොමු කරනු ලැබේ. ඒ තුළින් ද්විතීය මට්ටමේ දී  අධ්‍යනය කරනු ලැබූ බුද්ධ ධර්මය විෂය, නිපුණතා පාදකව වඩාත් පුළුල් හා  ක්‍රමානුකූල අධ්‍යයනය කර ශිෂ්‍යයා යොමුවන අයුරින් මෙම විෂය අන්තර්ගතය ඉදිරිපත්  කිරීමට මෙහි දී උත්සාහ ගෙන ඇත.

ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයට මුල් තැන දෙමින් ශිෂ්‍යයාට වඩාත් රුචිකත්වයෙන් විෂය කරුණු අධ්‍යයනය කිරීමට මෙමගින් අවකාශ සැලසේ. වනපොත් කිරීමට හෝ අසා දැනගැනීමට වඩා දැනුම තමා විසින්ම එක්රැස් කොට ස්වාධීනව විශ්ලේෂණය කරමින් ජීවිතාවබෝධය සඳහා යොදා ගැනීමට ශිෂ්‍යයා පෙළඹවීමත්, ජීවන යහපුරුදුවලින් හා සමබර පෞරුෂයකින් හෙබි අනාගත පරපුරක් ජාතියට දායාද කිරීමත් මෙහි අපේක්ෂාවයි.

# ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතුය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම.
2. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.
3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුම්වත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත්වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.
4. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.
5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.
6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.
7. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදුවන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.
8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමිකර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වු ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

1. **සන්නිවේදන නිපුණතා**

   සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

   **සාක්ෂරතාව** සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදිව සහ නිරවුල්ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

   **සංඛ්‍යා පිළිබඳ දැනුම** භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකුල ඉලක්කම් භාවිතය

   **රූපක භාවිතය** රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

   **තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද, සේවා පරිශ්‍රයන් තුළදී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

2. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

   - නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලි හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
   - ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
   - චිත්තවේගී බුද්ධිය

3. **පරිසරයට අදාළ නිපුණතා**

   මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

   **සමාජ පරිසරය** ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

   **ජෛව පරිසරය** සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත්වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

4. **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**
   ආර්ථික සංවර්ධනයට දායක වීම.
   තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම.
   හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම.
   යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

5. **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**
   පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලනසේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

6. **ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**
   සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

7. **ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා**
   ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.

## විෂය අරමුණු

බෞද්ධ ශිෂ්ටාචාරයෙහි මෙන්ම එහි පදනම වන බුද්ධ ධර්මයෙහි ද මූලික අරමුණ වන්නේ හුදෙක් පාරලෞකික සුගතියක් හෝ විමුක්ති ප්‍රතිලාභයක් උදෙසා මග පෙන්වීම ම නොවේ. මානව වර්ගයාට ඓහලෞකික වශයෙන් පෞද්ගලිකව හා සාමූහිකව තෘප්තිමත් සාමකාමී ජීවිතයක් ගත කිරීම සඳහා වන ප්‍රායෝගික මාර්ගය පෙන්වාදීම ද මූලික අරමුණක් බව ඊට අදාළ බුද්ධ දේශනාවන්ගෙන් මෙන් ම ශාසන ඉතිහාසයෙන් ද සනාථ වේ.

මෙහි ඇතුළත් නිපුණතා මාලාව තුළින් මූලික වශයෙන් ම පහත දැක්වෙන අරමුණු සාධනය කරගැනීමට අපේක්ෂා කෙරේ.

1. සමානාත්මතාවාදී, විචාරපූර්වක හා ප්‍රගතිශීලී ආකල්ප ශිෂ්‍ය ප්‍රජාව තුළ සංවර්ධනය කිරීම.
2. සිව්බඹ විහරණයෙන් පෝෂිත සමාජානුයෝගී චරිත ගොඩනැගීමට දායක වීම.
3. ස්ව ශක්තිය කෙරෙහි විශ්වාසය තබන, හේතුඵලවාදී ව සිතා කටයුතු කරන දරුපරපුරක් බිහි කිරීම.
4. බෞද්ධ පදනමක් ඇති චාරිත්‍ර වාරිත්‍රාදිය ප්‍රායෝගිකව ප්‍රගුණ කරන මිනිසුන් ඇතිකිරීම.
5. අතීත ආදර්ශයන් තුළින් අනාගතය ගොඩනගා ගැනීමට මග පෙන්වීම.
6. වඩාත් ප්‍රබුද්ධ, සංවේදී හා නිර්මාණශීලී දරුවන් සමාජයට දායාද කිරීම.
7. හරවත් හා සමබර පෞරුෂයකින් හෙබි මතුපරපුරක් බිහි කිරීම.

බෞද්ධ ශිෂ්ටාචාරය විෂය ඉගෙනීම යනු ආගමික හා දාර්ශනික වටිනාකම් සහිත දැනුම් සම්භාරයක් එකතු කර ගැනීම පමණක් නොවන බවද, එය පුද්ගලයාගේ හා සමාජයේ ආධ්‍යාත්මික හා ලෞකික අභිවෘද්ධිය උදෙසා මග සලසා ගැනීමක් විය යුතු බවද ගුරු සිසු දෙපක්ෂය විසින් ම වටහා ගැනීමත්, ඒ අනුව ක්‍රියා කිරීමත් මෙහි ඇතුළත් සියලු නිපුණතාවන්ගේ පොදු අර්ථය බව සැලකිය යුතු ය.

## ජාතික පොදු අරමුණු සහ විෂය අරමුණු අතර සම්බන්ධතාව දක්වන වගුව

| ජාතික පොදු අරමුණු | විෂය අරමුණු |
|---|---|
| 1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතිය විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව ජාතික සෘජු ගුණය ජාතික සමගිය එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම හා ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම. | 1. සමානාත්මතාවාදී, විචාරපූර්වක හා ප්‍රගතිශීලී ආකල්ප ශිෂ්‍ය ප්‍රජාව තුළ සංවර්ධනය කිරීම.<br>2. සිව්බඹ විහරණයෙන් පෝෂිත සමාජානුයෝගී චරිත ගොඩනැගීමට දායක වීම.<br>6. වඩාත් ප්‍රබුද්ධ, සංවේදී හා නිර්මාණශීලී දරුවන් සමාජයට දායාද කිරීම.<br>7. හරවත් හා සමබර පෞරුෂයකින් හෙබි මතුපරපුරක් බිහි කිරීම. |
| 2. වෙනස්වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම හා සංරක්ෂණය කිරීම. | 3. ස්ව ශක්තිය කෙරෙහි විශ්වාසය තබන, හේතුඵලවාදී ව සිතා කටයුතු කරන දරුපරපුරක් බිහි කිරීම.<br>4. බෞද්ධ පදනමක් ඇති චාරිත්‍ර වාරිත්‍රාදිය ප්‍රායෝගිකව ප්‍රගුණ කරන මිනිසුන් ඇතිකිරීම.<br>5. අතීත ආදර්ශයන් තුළින් අනාගතය ගොඩනගා ගැනීමට මග පෙන්වීම. |
| 3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත්වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයකින් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරිම සහ පවත්වාගෙන යාමට සහාය වීම. | 1. සමානාත්මතාවාදී, විචාරපූර්වක හා ප්‍රගතිශීලී ආකල්ප ශිෂ්‍ය ප්‍රජාව තුළ සංවර්ධනය කිරීම.<br>2. සිව්බඹ විහරණයෙන් පෝෂිත සමාජානුයෝගී චරිත ගොඩනැගීමට දායක වීම.<br>6. වඩාත් ප්‍රබුද්ධ, සංවේදී හා නිර්මාණශීලී දරුවන් සමාජයට දායාද කිරීම. |

| | |
|---|---|
| 4. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම. | 1. සමානාත්මතාවාදී, විචාරපූර්වක හා ප්‍රගතිශීලී ආකල්ප ශිෂ්‍ය ප්‍රජාව තුළ සංවර්ධනය කිරීම.<br>2. සිව්බඹ විහරණයෙන් පෝෂිත සමාජානුයෝගී චරිත ගොඩනැගීමට දායක වීම.<br>4. බෞද්ධ පදනමක් ඇති චාරිත්‍ර වාරිත්‍රාදිය ප්‍රායෝගිකව ප්‍රගුණ කරන මිනිසුන් ඇතිකිරීම.<br>7. හරවත් හා සමබර පෞරුෂයකින් හෙබි මතුපරපුරක් බිහි කිරීම. |
| 5. සුසාමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව ආරම්භක ශක්තිය විචාරශීලී චින්තනය වගකීම හා වගවීම ඇතුලු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ වර්ධනය කිරීම. | 3. ස්ව ශක්තිය කෙරෙහි විශ්වාසය තබන, හේතුඵලවාදී ව සිතා කටයුතු කරන දරුපරපුරක් බිහි කිරීම.<br>4. බෞද්ධ පදනමක් ඇති චාරිත්‍ර වාරිත්‍රාදිය ප්‍රායෝගිකව ප්‍රගුණ කරන මිනිසුන් ඇතිකිරීම.<br>6. වඩාත් ප්‍රබුද්ධ, සංවේදී හා නිර්මාණශීලී දරුවන් සමාජයට දායාද කිරීම.<br>7. හරවත් හා සමබර පෞරුෂයකින් හෙබි මතුපරපුරක් බිහි කිරීම. |

| | |
|---|---|
| 6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම. | 1. සමානාත්මතාවාදී, විචාරපූර්වක හා ප්‍රගතිශීලී ආකල්ප ශිෂ්‍ය ප්‍රජාව තුළ සංවර්ධනය කිරීම.<br>2. සිව්බඹ විහරණයෙන් පෝෂිත සමාජානුයෝගී චරිත ගොඩනැගීමට දායක වීම.<br>3. ස්ව ශක්තිය කෙරෙහි විශ්වාසය තබන, හේතුඵලවාදී ව සිතා කටයුතු කරන දරුපරපුරක් බිහි කිරීම.<br>4. බෞද්ධ පදනමක් ඇති චාරිත්‍ර වාරිත්‍රාදිය ප්‍රායෝගිකව ප්‍රගුණ කරන මිනිසුන් ඇතිකිරීම. |
| 7. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදුවන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණදීමේ හැකියාව වර්ධනය කිරිම. | 1. සමානාත්මතාවාදී, විචාරපූර්වක හා ප්‍රගතිශීලී ආකල්ප ශිෂ්‍ය ප්‍රජාව තුළ සංවර්ධනය කිරීම.<br>2. සිව්බඹ විහරණයෙන් පෝෂිත සමාජානුයෝගී චරිත ගොඩනැගීමට දායක වීම.<br>6. වඩාත් ප්‍රබුද්ධ, සංවේදී හා නිර්මාණශීලී දරුවන් සමාජයට දායාද කිරීම.<br>7. හරවත් හා සමබර පෞරුෂයකින් හෙබි මතුපරපුරක් බිහි කිරීම. |
| 8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්ති.ය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම. | 1. සමානාත්මතාවාදී, විචාරපූර්වක හා ප්‍රගතිශීලී ආකල්ප ශිෂ්‍ය ප්‍රජාව තුළ සංවර්ධනය කිරීම.<br>2. සිව්බඹ විහරණයෙන් පෝෂිත සමාජානුයෝගී චරිත ගොඩනැගීමට දායක වීම.<br>4. බෞද්ධ පදනමක් ඇති චාරිත්‍ර වාරිත්‍රාදිය ප්‍රායෝගිකව ප්‍රගුණ කරන මිනිසුන් ඇතිකිරීම.<br>5. අතීත ආදර්ශයන් තුළින් අනාගතය ගොඩනගා ගැනීමට මග පෙන්වීම. |

## විෂය නිර්දේශය පාසල් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|
| 12 | 1 | 1.1<br>1.2<br>1.3<br>1.4 | 26<br>32<br>21<br>21 |
| | 2 | 2.1<br>2.2<br>3.1<br>3.2<br>3.3 | 30<br>16<br>16<br>18<br>20 |
| | 3 | 4.1<br>4.2<br>5.1<br>5.2<br>5.3<br>5.4 | 18<br>18<br>19<br>17<br>15<br>13 |
| 13 | 1 | 6.1<br>7.1<br>7.2<br>7.3<br>7.4 | 32<br>22<br>16<br>16<br>14 |
| | 2 | 8.1<br>8.2<br>8.3<br>8.4<br>9.1 | 20<br>20<br>20<br>20<br>20 |
| | 3 | 9.2<br>10.1<br>10.2<br>10.3 | 24<br>34<br>18<br>24 |

## විෂය නිර්දේශය
## 12 වන ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0<br>ප්‍රාග් බෞද්ධ හා බුද්ධ කාලීන ආගමික සාමාජික දේශපාලනික හා ආර්ථික පසුබිම විමර්ශනාත්මකව දකියි. | 1.1<br>භාරතීය බ්‍රාහ්මණ සමාජ ධර්ම අධ්‍යයනය කර ඒ පිළිබඳ බෞද්ධ ආකල්පය විමසා බලයි. | • වර්ණ ධර්ම<br>• ස්වධර්ම<br>• ආපද්ධර්ම<br>• ආශ්‍රම ධර්ම<br>• යාගය<br>• එම ඉගැන්වීම් පිළිබඳ බෞද්ධ විචාරය<br>• කාන්තාව පිළිබද බ්‍රාහ්මණ ඉගැන්වීම්<br>• කාන්තාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් | • භාරතීය සමාජ ධර්ම පිළිබඳ විචාරාත්මක දැනුමක් ලබා ගනියි.<br>• බ්‍රාහ්මණ සමාජ ධර්මවල නිසරුබව පිළිගනියි.<br>• මිනිස් සංහතියේ ඒකත්වය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්වල විශිෂ්ටත්වය ප්‍රකට කරමින් විවිධ ක්‍රියාකාරකම්වල නිරත වෙයි.<br>• සමාජ ජීවිතයේ දී සමානාත්මතාවෙන් කටයුතු කරයි. | 26 |
| | 1.2<br>බුද්ධ කාලීන භාරතීය ශ්‍රමණ ගුරුකුල හඳුනා ගනිමින් ශ්‍රමණ බ්‍රාහ්මණ සම්ප්‍රදායයන්හි විශේෂතා අධ්‍යයනය කරයි. | • නිගණ්ඨ, ආජීවක, ජටිල, පරිබ්‍රාජක යන ශ්‍රමණ ගුරුකුල<br>• බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදායයේ සුවිශේෂතා<br>• ෂට් ශාස්තෘවරුන්ගේ ඉගැන්වීම් සහ ඒ පිළිබඳ බෞද්ධ විචාරය<br>• ශ්‍රමණ සංස්කෘතියෙහි අනන්‍යතා ලක්ෂණ<br>• බ්‍රාහ්මණ සංස්කෘතියෙහි අනන්‍යතා ලක්ෂණ | • භාරතීය ශ්‍රමණ ගුරුකුලවල ඉගැන්වීම් විචාරාත්මකව හා තුලනාත්මකව පැහැදිලි කරයි.<br>• භාරතීය ශ්‍රමණ ඉගැන්වීම්වල ඌනතා ඇති බව පිළිගනියි.<br>• ශ්‍රමණ සංස්කෘතිය හා බ්‍රාහ්මණ සංස්කෘතියේ අනන්‍යතා ලක්ෂණ වගුගත කරයි.<br>• නිසරු දේ බැහැරකොට සරු දේ ක්‍රියාවට නගයි. | 32 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.3<br>බුද්ධ කාලීන භාරතීය දේශපාලනික ව්‍යුහය හා ක්‍රියාකාරිත්වය ගවේෂණය කරයි. | • සොළොස් මහා ජනපද<br>• රාජාණ්ඩු ක්‍රමය හා සමූහාණ්ඩු ක්‍රමය (ගණ තන්ත්‍ර)<br>• බුද්ධ කාලීන භාරතීය පාලකයන් හා බුදුරජාණන් වහන්සේ අතර පැවති සම්බන්ධතා | • බුද්ධකාලීන භාරතීය දේශපාලන පසුබිම පිළිබඳ අවබෝධයක් ලබා ගනියි.<br>• රාජාණ්ඩු හා සමූහාණ්ඩු ක්‍රමවල සාධනීය ලක්ෂණ මෙන්ම ගැටලු ද අවබෝධ කර ගැනීමට පෙළඹෙයි.<br>• පාලකයන් සමඟ සහයෝගයෙන් කටයුතු කරයි.<br>• පරිපාලන කටයුතුවල දී නොගැටී ක්‍රියා කරයි. | 21 |
| | 1.4<br>ක්‍රි.පූ. හයවැනි සියවසේ ආර්ථික පසුබිම හැඳින ගනී. | • වාණිජ්‍යකරණය හා නාගරීකරණය<br>• කෘෂිකර්මය, වෙළඳාම හා වෙනත් කර්මාන්ත | • ක්‍රි.පූ. හයවැනි සියවසේ ආර්ථික පසුබිම විස්තර කරයි.<br>• සමාජ අවශ්‍යතා මත විවිධ වෘත්තීන් බිහිවන බව පිළිගනියි.<br>• බුද්ධකාලීන ජීවන වෘත්තීන්හි නාමාවලියක් පිළියෙල කරයි.<br>• අදාළ වෘත්තීන්හි කාර්යක්ෂමව කටයුතු කරයි. | 21 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 02.<br>බුදුරජාණන් වහන්සේගේ හා පරමාදර්ශී ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ විශිෂ්ට චරිත ලක්ෂණ අධ්‍යයනය කර ආදර්ශයට ගනියි. | 2.1<br>බුදුරජාණන් වහන්සේගේ සුවිශේෂ ගුණ හා විශිෂ්ට චරිත ලක්ෂණ අධ්‍යයනය කරයි. | • නව අරහාදී බුදුගුණ<br>• මහා කරුණාව<br>• මහා ප්‍රඥාව<br>• ආදර්ශවත් නායකත්වය<br>• විශිෂ්ට ශාස්තෘත්වය<br>• තාදි ගුණය<br>• පද්මාකාර ජීවිතය<br>• නිදහස් චින්තනය හා ආගමික සහනශීලී බව<br>• බුදුරජාණන් වහන්සේ පිළිබඳ සමකාලීන හා නූතන ඇගයීම් | • බුදුරජාණන් වහන්සේගේ විශිෂ්ටත්වය හඳුනා ගනියි.<br>• විශිෂ්ට බුදුගුණ චරිතායනයට පෙළඹෙයි.<br>• බුදුගුණ ප්‍රකට වන නිර්මාණකරණයෙහි යෙදෙයි.<br>• සැදැහැ සිතින් ආමිස හා ප්‍රතිපත්ති පූජාවන්හි නියැලෙයි. | 30 |
| | 2.2<br>බුද්ධ කාලීන පරමාදර්ශී ගිහි පැවිදි ශ්‍රාවක ශ්‍රාවිකා චරිත ඇගයීමට ලක් කරයි. | • ආනන්ද මහ රහතන් වහන්සේ<br>• සැරියුත් මහ රහතන් වහන්සේ<br>• මහා ප්‍රජාපතී ගෝතමී රහත් මෙහෙණින් වහන්සේ<br>• ඛේමා රහත් මෙහෙණින් වහන්සේ<br>• අනාථපිණ්ඩික උපාසකතුමා<br>• චිත්ත ගහපති උපාසකතුමා<br>• විශාඛා මහෝපාසිකාව<br>• නකුලමාතාව | • පරමාදර්ශී චරිතයක විශිෂ්ට ලක්ෂණ පැහැදිලි කරයි.<br>• පරමාදර්ශී ජීවිතයක් ගත කිරීමට අධිෂ්ඨාන කර ගනියි.<br>• ධර්මානුකූල ජීවිතයක් ගත කරයි.<br>• පරමාදර්ශී චරිතවලින් පිළිබිඹුවන යහගුණ විවිධ නිර්මාණ මගින් සමාජයට සම්ප්‍රේෂණය කරයි. | 16 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 03.<br>පුද්ගලයා, සමාජය හා දේශපාලන සංවිධාන පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් වටහාගෙන ඒ අනුව පෞරුෂය ගොඩනගා ගනියි. | 3.1<br>පුද්ගලයාගේ ස්වාමිත්වය හා ශක්‍යතා පිළිබඳ විමර්ශනය කරයි. | • පුද්ගල ස්වාමීත්වය, ස්වාධීනත්වය, ස්වච්ඡන්දතාව හා වගකීම පිළිබඳ සමකාලීන ඉගැන්වීම්<br>• පුද්ගල ස්වාමීත්වය, ස්වාධීනත්වය, ස්වච්ඡන්දතාව හා වගකීම පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් | • පුද්ගල ස්වාමිත්වය, ශක්‍යතාව හා වගකීම පිළිබඳ තුලනාත්මකව අවබෝධ කර ගනියි.<br>• සදාචාරාත්මක ශික්ෂණයට පෙළඹෙයි.<br>• අභියෝග ජය ගනිමින් ක්‍රියා කරයි.<br>• ආත්ම විශ්වාසයෙන් කටයුතු කිරීමේ වැදගත්කම ප්‍රදර්ශනය කරයි. | 16 |
| | 3.2<br>සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ විග්‍රහය අධ්‍යයනය කරයි. | • සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් | • සමාජ ප්‍රභවය හා විකාශය පාරභෞතික ප්‍රස්තුතවලින් බැහැර වූවක් බව ප්‍රත්‍යක්ෂ කර ගනියි.<br>• සමාජ ප්‍රභවය හා විකාශය හේතුඵලවාදීව සිදුවූවක් බව පෙන්වා දෙයි.<br>• සමාජ විවිධත්වය හා විචිත්‍රත්වය අවබෝධ කොටගෙන ක්‍රියා කරයි.<br>• සමාජ සංකීර්ණතා තුළින් පැන නගින අභියෝගවලට සාර්ථකව මුහුණ දෙයි. | 18 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.3<br>බෞද්ධ දේශපාලන මූලධර්ම විචාරශීලීව අධ්‍යයනය කරයි. | • පංචශීල ප්‍රතිපදාව<br>• දස රාජ ධර්ම<br>• දස සක්විතිවත්<br>• සප්ත අපරිහානිය ධර්ම<br>• සතර සංග්‍රහවස්තු<br>• සතර අගති විරතිය<br>• ලෝක පාලන ධර්ම<br>• කූටදන්ත සූත්‍රාගත දේශපාලන මූලධර්ම<br>• පාලන තන්ත්‍රය විෂයෙහි ප්‍රජා වගකීම් | • පරමාදර්ශී පාලන තන්ත්‍රයක් සඳහා වූ බෞද්ධ දේශපාලන මූලධර්ම විශ්ලේෂණය කරයි.<br>• බෞද්ධ දේශපාලන මූලධර්ම මත පදනම්ව යහපාලනයක් ගොඩ නැගීමට උත්සුක වෙයි.<br>• ආදර්ශවත් ප්‍රජා නායකයකු ලෙස ක්‍රියා කරයි.<br>• සමාජ සුභසාධනය හා සාධාරණත්වය උදෙසා කැපවෙයි. | 20 |
| 04.<br>පුද්ගලයාගේ හා සමාජයේ යහපැවැත්මට උපයෝග වන බෞද්ධ ආචාර ධර්ම අධ්‍යයනය කර උභයාර්ථ සාධනයට ක්‍රියා කරයි. | 4.1<br>පින්පව් කුසල් අකුසල් හැඳින ගනිමින් හොඳ නරක විනිශ්චය කිරීමෙහිලා භාවිත බෞද්ධ නිර්ණායක පැහැදිලි කරයි. | • හොඳ නරක විනිශ්චය කිරීමෙහිලා භාවිත බෞද්ධ නිර්ණායක<br>• දස පින්කිරියවත්<br>• දස කුසල් හා දස අකුසල් | • හොඳ නරක විනිශ්චය කිරීමෙහිලා භාවිත නිර්ණායක නිරවුල්ව හඳුනා ගනියි.<br>• සදාචාරාත්මකව ජීවත්වීමට අධිෂ්ඨාන කර ගනියි.<br>• පව් බැහැර කොට කුසල් දහම් වඩයි.<br>• කුසල් දහම් සඳහා සමාජය පොළඹවයි. | 18 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 4.2<br>පුද්ගල හා සමාජ සංවර්ධනයට අදාළ බෞද්ධ ආචාර ධර්ම හැඳින ගනියි. | • ශ්‍රද්ධාව<br>• පන්සිල් හා අටසිල්<br>• සිව්බඹ විහරණ<br>• සතර සංග්‍රහ වස්තු<br>• හිරි ඔතප්<br>• අල්පේච්ඡතාව, සන්තුෂ්ටිතාව, සුභරතාව<br>• නීතිගරුකත්වය හා සහජීවනය | • බෞද්ධ සාරධර්ම නිවැරදිව විස්තර කරයි.<br>• සහජීවනයෙන් ජීවත්වීමට හුරුවෙයි.<br>• බෞද්ධ සාරධර්මානුකූලව දිවි ගෙවයි.<br>• යහගුණ වර්ධනයට අනුබල දෙයි. | 18 |
| 05.<br>පරිසරය, ආර්ථිකය හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ප්‍රායෝගිකව භාවිත කරමින් අර්ථවත් හා තෘප්තිමත් ජීවිතයක් ගත කරයි. | 5.1<br>පරිසරය පිළිබඳ බෞද්ධ ආකල්පය පැහැදිලි කරයි. | • බුදුසමය හා පරිසරය<br>• පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්<br>• සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් | • පරිසරය හා සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ බෞද්ධ ආකල්පය අනාවරණය කර ගනියි.<br>• පරිසර සංරක්ෂණයට හා සෞන්දර්ය රසාස්වාදයට පෙළඹෙයි.<br>• ජීවිතය සංවේදීව හා යථාර්ථවාදීව ගත කරයි.<br>• සත්ත්ව ප්‍රජාවගේ යහපැවැත්ම උදෙසා කටයුතු කරයි. | 19 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.2<br>ආර්ථිකය පිළිබඳ බෞද්ධ චින්තනය විමර්ශනය කරයි. | • ධනෝපායනය, ධනපරිහරණය හා ආර්ථික සුරක්ෂිතතාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්<br>• ශ්‍රමය, ධනය සහ සමාජ සුභ සිද්ධිය අතර පවතින අන්‍යෝන්‍ය සම්බන්ධතාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් | • ආර්ථිකය සම්බන්ධ බෞද්ධ ආකල්පය මූලාශ්‍රයානුසාරයෙන් පැහැදිලි කරයි.<br>• විධිමත් ආර්ථික සමෘද්ධියක් ඇතිකර ගැනීමට උනන්දු වෙයි.<br>• ධාර්මික ආර්ථික ප්‍රතිපදාවකට අනුගතව ක්‍රියා කරයි.<br>• විධිමත් හා දැහැමි ආර්ථික සංවර්ධන සැලසුම් සකස් කරයි. | 17 |
| | 5.3<br>භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ චින්තනය අධ්‍යයනය කරයි. | • භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් | • භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අධ්‍යයනය කරයි.<br>• භෞතික සම්පත් ඵලදායි ලෙසත්, කාර්යක්ෂම ලෙසත් යොදගැනීමට හුරුවෙයි.<br>• විධිමත් කළමනාකාරිත්වයකින් යුතුව දෛනික ජීවිතය ගත කරයි.<br>• භෞතික සම්පත් විධිමත්ව කළමනාකරණය කිරීමේ අගය පෙන්වා දෙයි. | 15 |
| | 5.4<br>ලෞකික සැප පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් හැඳින ගනියි. | • ඉඳුරන් පිනවීම හා පංචකාම සම්පත්තිය<br>• ඉඳුරන් පිනවීම් සීමා හා දැහැමි කම්සුව<br>• අත්ථි සුඛ, භෝග සුඛ, අණණ සුඛ, අනවජ්ජ සුඛ | • ලෞකික සැපය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් විස්තර කරයි.<br>• ඉඳුරන් පිනවීම සීමා කළ යුතු බව පිළිගනියි.<br>• ධාර්මිකව කම්සැප විඳිමින් තෘප්තිමත් ගෘහ ජීවිතයක් ගත කරයි.<br>• අන්‍යයන් සමග සහයෝගයෙන් කටයුතු කරයි. | 13 |

## 13 වන ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 06.<br>මූලාශ්‍රය අනුසාරයෙන් බෞද්ධ සාරධර්ම අධ්‍යයනය කොට ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරයි. | 6.1<br>අගාරික පටිපදවට අදාළ බෞද්ධ සාරධර්ම මූලාශ්‍රයානුසාරයෙන් අධ්‍යයනය කරයි. | සිගාලෝවාද සූත්‍රය<br>• සදිසා නමස්කාරය<br>• භෝග විනාශ මුඛ<br><br>• පරාභව සූත්‍රය - පිරිහීමේ කරුණු<br>• මංගල සූත්‍රය - දියුණුවීමේ කරුණු<br><br>**<u>ධම්ම පදය</u>**<br>මනෝ පුබ්බංගමා ධම්මා........<br>(යමක වග්ගය 1 ගාථාව)<br><br>මනෝ පුබ්බංගමා ධම්මා........<br>(යමක වග්ගය 2 ගාථාව)<br><br>උට්ඨානවතෝ සතිමතෝ ......<br>(අප්පමාද වග්ගය 4 ගාථාව)<br><br>අප්පමාදෙන මඝවා .........<br>(අප්පමාද වග්ග 10 ගාථාව)<br><br>න පරේසං විලෝමානි<br>(පුප්ඵ වග්ගය 7 ගාථාව)<br><br>යෝ බාලෝ ම**ඤ්ඤ**ති බාල්‍යං.......<br>(බාලවග්ගය 4 ගාථාව)<br><br>මධුවා ම**ඤ්ඤ**ති බාලෝ.......<br>(බාලවග්ගය 10 ගාථාව)<br><br>නිධීනං ව පවත්තාරං.......<br>(පණ්ඩිත වග්ගය 1 ගාථාව)<br><br>න භජේ පාපකෙ මිත්තේ<br>(පණ්ඩිත වග්ගය 3 ගාථාව)<br><br>න අත්තහේතු න පරස්ස හේතු<br>(පණ්ඩිත වග්ගය 9 ගාථාව) | • මූලාශ්‍රයාගත බෞද්ධ සාරධර්ම හඳුනා ගනියි.<br>• චරිත සංවර්ධනය උදෙසා බෞද්ධ සදුපදේශ උපයෝගි කොට ගනියි.<br>• ආදර්ශවත් ජීවිතයක් ගත කරයි.<br>• බෞද්ධ සාරධර්මවල වටිනාකම ප්‍රකට කරයි. | 32 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | සහස්සමපි චේ වාචා......<br>(සහස්ස වග්ගය 1 ගාථාව)<br><br>යෝ චේ වස්සසතං ජීවේ<br>(සහස්ස වග්ගය 13 ගාථාව)<br><br>අචරිත්වා බ්‍රහ්මචරියං..........<br>(ජරාවග්ගය 11 ගාථාව)<br><br>අත්තානං චේ පියං ජඤ්ඤා<br>(අත්ත වග්ගය 1 ගාථාව)<br><br>අත්තනා'ව කතං පාපං......<br>(අත්ත වග්ගය 5 ගාථාව)<br><br>සුකරානි අසාධූනි .......<br>(අත්ත වග්ගය 7 ගාථාව)<br><br>ජයං වේරං පසවති .....<br>(සුඛ වග්ගය 5 ගාථාව)<br><br>තණ්හාය ජායතී සෝකෝ ....<br>(පිය වග්ගය 8 ගාථාව)<br><br>අක්කෝධේන ජිනේ කෝධං..<br>(කෝධ වග්ගය 3 ගාථාව)<br><br>කායේන සංවරෝ සාධු......<br>(භික්ඛු වග්ගය 2 ගාථාව) | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 07.<br>බුදුරජාණන් වහන්සේ ජීවමාන සමයේ සිට කණිෂ්ක රාජ්‍ය සමය තෙක් ශාසන ඉතිහාසයේ සුවිශේෂ සිද්ධි අධ්‍යයනය කර බුදුසසුනේ චිරස්ථිතිය උදෙසා කැපවීමෙන් ක්‍රියා කරයි | 7.1<br>බුද්ධ කාලීන ධර්ම දූත සේවාව පිළිබඳ සමාලෝචනයක යෙදෙයි | • බුදුරජාණන් වහන්සේගේ ධර්ම චාරිකා<br>• බුදුරජාණන් වහන්සේ ධරමාන සමයේ භික්ෂු භික්ෂුණී ධර්ම දූත සේවා | • බුද්ධ කාලීනව පැවති බෞද්ධ ධර්මදූත සේවාවන් විස්තර කරයි.<br>• බුදුරජාණන් වහන්සේ හා තත්කාලීන ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ ධර්මදූත සේවාව අගය කරයි.<br>• අර්ථවත් සන්නිවේදනයෙහි යෙදෙයි.<br>• යහපත් සන්නිවේදනයෙහි වටිනාකම සමාජගත කරයි. | 22 |
| | 7.2<br>භාරතීය ථේරවාද ධර්ම සංගායනා පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයනයක යෙදෙයි | • ත්‍රිවිධ ථේරවාද සංගායනා | • ථේරවාද ත්‍රිවිධ සංගායනාවන්හි පසුබිම හා ප්‍රතිඵල අධ්‍යයනය කරයි.<br>• අභියෝග හමුවේ ක්‍රියාකළ යුතු ආකාරය වටහා ගනියි.<br>• ශාසනික වගකීම් හා කාර්යභාරයන් ඉටුකරයි.<br>• ශාසනික සුරක්ෂිතතාව පිණිස ක්‍රියා කරයි. | 16 |
| | 7.3<br>අශෝක රජතුමාගේ හා කණිෂ්ක රජතුමාගේ ශාසනික මෙහෙය ඇගයීමට ලක්කරයි | • අශෝක අධිරාජයාගේ හා කණිෂ්ක රජතුමාගේ ශාසනික සේවාව | • අශෝක රජතුමාගේ හා කණිෂ්ක රජතුමාගේ ශාසනික සේවාවෙහි වැදගත්කම පෙන්වා දෙයි.<br>• ශාසනික සේවාවන්හි යෙදීමට පුරෝගාමී වෙයි.<br>• ශාසන චිරස්ථිතිය උදෙසා කැපවෙයි<br>• ශාසනමාමක වෙයි. | 16 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.4<br>භාරතීය බෞද්ධ විශ්ව විද්‍යාලයන්හි අධ්‍යාපන හා පරිපාලන පටිපාටිය හැඳින ගනියි. | • නාලන්දා විශ්වවිද්‍යාලය<br>• වික්‍රමශිලා විශ්වවිද්‍යාලය<br>• වලභි විශ්වවිද්‍යාලය | • භාරතයෙහි පැවති ඉපැරණි බෞද්ධ විශ්වවිද්‍යාල පිළිබඳව අවබෝධ කර ගනියි.<br>• බෞද්ධ විෂයයන් පිළිබඳ උසස් අධ්‍යාපනයක් හා ඒ සඳහා නිසි අධ්‍යාපන පටිපාටියක් පැවති බව පිළිගනියි.<br>• අධ්‍යාපනයට අදාළ සැලසුම් සකස් කරයි.<br>• ගුණ නුවණින් යුතු පුරවැසියකු බිහිකිරීමට දායක වෙයි. | 14 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 08.<br>ශ්‍රී ලංකාවේ ආගමික දේශපාලනික හා සමාජීය සංවර්ධනය උදෙසා බෞද්ධ ශිෂ්ටාචාරය පදනම් වූ ආකාරය විමර්ශනය කරමින් ඊට අනුගත වෙයි. | 8.1<br>ප්‍රාග් මහින්ද යුගයේ ශ්‍රී ලංකාවේ පැවති ඇදහිලි හා විශ්වාස මහින්දගමනයෙන් පසු බුදු සමයට අනුව හැඩගැසුණු ආකාරය පැහැදිලි කරයි. | • ප්‍රාග් මහින්ද යුගයේ පැවති ආගමික ඇදහිලි හා විශ්වාස<br>• එම ඇදහිලි හා විශ්වාස බුදු සමයට අනුව හැඩගැසුණු ආකාරය | • ප්‍රාග් මහින්ද යුගයේ පැවති ආගමික ඇදහිලි හා විශ්වාසයන් බුදු සමයට අනුව හැඩගැසුණු ආකාරය අවබෝධ කොට ගනියි.<br>• බෞද්ධාගමික පිළිවෙත් අගය කරයි.<br>• බෞද්ධාගමික පිළිවෙත් විෂයෙහි කැපවී කටයුතු කරයි.<br>• බෞද්ධාගමික පිළිවෙත්වල අගය පෙන්වා දෙයි. | 20 |
| | 8.2<br>රාජ්‍ය පාලනයේදී ශ්‍රී ලාංකේය රජවරුන් බුදු සමයෙන් ලද ආභාසය හා ඔවුන් සිදුකළ ශාසනික සේවාව හැඳින ගනියි. | • රාජ්‍ය පාලනය කෙරෙහි බෞද්ධ ආභාසය<br>• දේවානම්පියතිස්ස, දුටුගැමුණු, වළගම්බා, මහසෙන් යන රජවරුන්ගේ ශාසනික සේවාව | • ශ්‍රී ලාංකේය රාජ්‍ය පාලනය විෂයෙහි බෞද්ධ ආභාසය හා ඉපැරණි රාජ්‍ය පාලකයන්ගේ ශාසනික මෙහෙය විස්තර කරයි.<br>• ශ්‍රී ලාංකේය රජවරු බුදුසමයේ චිරස්ථිතිය හා සංවර්ධනය පිණිස ක්‍රියා කළ බව පිළිගනියි.<br>• බුදු සසුනේ චිරස්ථිතියට හා සංවර්ධනයට දයක වෙයි.<br>• ශ්‍රී ලාංකේය දේශපාලන අනන්‍යතාව ප්‍රදර්ශනය කරයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 8.3<br>මහාවිහාරය හා අභයගිරිය කේන්ද්‍ර කර ගනිමින් බිහිවූ ආගමික, සමාජයීය හා සංස්කෘතික ප්‍රවණතා හැඳින ගනියි. | • මහා විහාරය හා අභයගිරිය කේන්ද්‍රකොට ගෙන බිහිවූ ආගමික සමාජයීය හා සංස්කෘතික ප්‍රවණතා | • මහා විහාරය හා අභයගිරිය කේන්ද්‍රකර ගනිමින් ලක්දිව ඇති වූ විවිධ ප්‍රවණතාවන් හඳුනා ගනියි.<br>• මහා විහාරය හා අභයගිරිය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ බෞද්ධ මධ්‍යස්ථාන බව පිළි ගනියි.<br>• ආගමික මූලස්ථානයන්හි කාර්යභාරයන් හා වගකීම් අවබෝධ කොටගෙන කටයුතු කරයි.<br>• ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතියේ අනන්‍යතාව සමාජගත කරයි. | 20 |
| | 8.4<br>බුදු සමයෙන් හැඩගැසුණු සිරිත් විරිත් හා සාරධර්ම ශ්‍රී ලාංකේය සමාජය තුළ තහවුරු වූ ආකාරය විමර්ශනයට ලක් කරයි. | • පුද්ගලයාගේ උපතේ සිට මරණය තෙක් ජීවිතයේ වැදගත් අවස්ථාවන් සමග බැඳුණු බෞද්ධ සිරිත් විරිත්<br>• ශාසන මාමකත්වය, දන්දීම, ආගන්තුක සත්කාරය, වැඩිහිටියන්ට සැලකීම, පරෝපකාරය, අවිහිංසාව, ගිලානෝපස්ථානය | • බෞද්ධ සාරධර්මවලින් පෝෂණය වූ ශ්‍රී ලංකාවේ සිරිත් විරිත් අධ්‍යයනය කරයි.<br>• බෞද්ධ සාරධර්ම සාර්ථක ජීවිතයකට පදනම බව සැකහැර තහවුරු කර ගනියි.<br>• බෞද්ධ සිරිත් විරිත් හා සාරධර්මවලින් පිරිපුන් සාර්ථක දිවිපෙවතක් ගත කරයි.<br>• යහපත් සිරිත් විරිත් හා සාරධර්ම පිරි සමාජයක් බිහි කිරීමට පුරෝගාමී වෙයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 09.<br>බුදු දහම පැතිර ගිය ආසියාතික රටවල ජන ජීවිතය බෞද්ධ සාරධර්ම වලින් පෝෂණය වූ අයුරු ගවේෂණය කරමින් බෞද්ධ උරුමය රැක ගැනීමට දයක වෙයි | 9.1<br>මියන්මාරයට (බුරුමයට) හා ථායිලන්තයට (සියමට) බුදු දහම සම්ප්‍රාප්ත වීම හා එම රටවල ජනජීවිතය බෞද්ධ සාරධර්මවලින් පෝෂණය වූ ආකාරය ගවේෂණය කරයි | • මියන්මාරයට බුදුදහම හඳුන්වාදීම සහ එරට සංස්කෘතිය බුදු සමයෙන් පෝෂණය වූ ආකාරය<br>• ථායිලන්තයට බුදු දහම හඳුන්වාදීම හා එරට සංස්කෘතිය බුදු සමයෙන් පෝෂණය වූ ආකාරය | • මියන්මාර හා ථායිලන්ත සංස්කෘතිය බුදු සමයෙන් පෝෂණය වූ අයුරු ගවේෂණය කරයි.<br>• මියන්මාර හා ථායිලන්ත බෞද්ධ සංස්කෘතියේ විශිෂ්ට ලක්ෂණ අගය කිරීමට පෙළඹෙයි.<br>• මියන්මාර හා ථායිලන්ත බෞද්ධ සංස්කෘතිය ආදර්ශනය කරයි.<br>• ජාත්‍යන්තරව බෞද්ධ සංස්කෘතිය ව්‍යාප්ත කිරීමෙහිලා දායක වෙයි. | 20 |
| | 9.2<br>චීනයට හා ජපානයට බුදු දහම සම්ප්‍රාප්ත වීම හා එම රටවල ජන ජීවිතය බෞද්ධ සාරධර්ම වලින් පෝෂණය වූ ආකාරය ගවේෂණය කරයි | • චීනයට බුදුදහම හඳුන්වාදීම සහ එරට සංස්කෘතිය බුදු සමයෙන් පෝෂණය වූ ආකාරය<br>• ජපානයට බුදුදහම හඳුන්වාදීම සහ එරට සංස්කෘතිය බුදු සමයෙන් පෝෂණය වූ ආකාරය | • චීන හා ජපන් සංස්කෘතීන් බුදු සමයෙන් පෝෂණය වූ අයුරු ගවේෂණය කරයි.<br>• චීන හා ජපන් බෞද්ධ සංස්කෘතියෙහි විශිෂ්ට ලක්ෂණ අගය කිරීමට පෙළඹෙයි.<br>• චීන හා ජපන් බෞද්ධ සංස්කෘතිය ආදර්ශනය කරයි.<br>• ජාත්‍යන්තරව බෞද්ධ සංස්කෘතික හුවමාරුවකට දායක වෙයි. | 24 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 10.<br>බුදු සමයෙන් පෝෂණය වූ භාරතීය, ශ්‍රී ලාංකේය කලා ශිල්ප හා සාහිත්‍යය ඇගයීමට ලක්කරමින් ඒවා සංරක්ෂණයටත් සංවර්ධනයටත් දායක වෙයි. | 10.1<br>බුද්ධ ප්‍රතිමා හා ස්තූප නිර්මාණයට අදාළ භාරතීය කලා සම්ප්‍රදාය හැඳින ගනියි. | • බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය<br>• ගන්ධාර සම්ප්‍රදාය, මථුරා සම්ප්‍රදාය<br>• ශ්‍රී ලංකාවේ බුද්ධ ප්‍රතිමා<br>• බුද්ධ ප්‍රතිමාවල මුද්‍රා සහ ආසන<br>• භාරතීය ස්තූප කලාව- සාංචි, භාරුත් ස්තූප<br>• ශ්‍රී ලාංකේය ස්තූප කලාවේ ආරම්භය<br>• විවිධ ස්තූප ආකෘති<br>• ශ්‍රී ලාංකේය ස්තූපයේ අනන්‍යතා ලක්ෂණ<br>• ස්තූපයේ සංකේතාර්ථ | • බුද්ධ ප්‍රතිමා හා ස්තූප නිර්මාණයකරණයෙහිලා පාදක වූ විවිධ සම්ප්‍රදායයන් හා ඒවායේ සුවිශේෂතා අධ්‍යයනය කරයි.<br>• බෞද්ධ කලා නිර්මාණ අගය කරයි<br>• බෞද්ධ කලා කෘති සුරක්ෂිත කිරීමට දායක වෙයි.<br>• බෞද්ධ කලා කෘති නිර්මාණය කිරීමෙහිලා පුරෝගාමී වෙයි. | 34 |
| | 10.2<br>අනුරාධපුර, පොළොන්නරු යුගවලට අයත් බුද්ධ ප්‍රතිමා හා ස්තූප අනුබද්ධ කලා නිර්මාණ පිළිබඳව අධ්‍යයනය කරයි. | • චෛතියඝර / වටදාගෙය<br>• බෝධිඝර<br>• පටිමාඝර<br>• වාහල්කඩ<br>• සඳකඩපහණ<br>• මුරගල<br>• කොරවක්ගල<br>• පියගැට පෙළ | • අනුරාධපුර, පොළොන්නරු යුගවලට අයත් බුද්ධ ප්‍රතිමා හා ස්තූප අනුබද්ධ කලා නිර්මාණ පිළිබඳව ගවේෂණය කරයි.<br>• ඉපැරණි ශ්‍රී ලාංකේය කලාකරුවාගේ කලා කෞශල්‍යය අගය කරයි.<br>• ඉපැරණි බෞද්ධ කලා කෘති සුරක්ෂිත කිරීමට දායක වෙයි.<br>• නව බෞද්ධ කලා කෘති නිර්මාණයෙහිලා උත්සුක වෙයි. | 18 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 10.3<br>ශ්‍රී ලාංකේය සාහිත්‍යය හා ශිල්ප කලාවන් පෝෂණයෙහිලා බුදුසමයෙන් ලැබුණු දයකත්වය ගවේෂණය කරයි. | • දඹදෙණිය හා කෝට්ටේ යුගවල සිංහල ගද්‍ය හා පද්‍ය සාහිත්‍යය බුදුසමයෙන් පෝෂණය වූ ආකාරය<br>• ශ්‍රී ලංකාවේ බෞද්ධ චිත්‍ර කලාවේ තේමා, අරමුණු හා සුවිශේෂතා<br>• ශ්‍රී ලංකාවේ ජනකවි, ගීත හා නාට්‍ය කෙරෙහි බෞද්ධ ආභාසය | • බුදුසමයෙන් පෝෂණය වූ ශ්‍රී ලාංකේය සාහිත්‍යය හා ශිල්ප කලාවන් විචාරශීලීව අධ්‍යයනය කරයි.<br>• සාහිත්‍යය හා විවිධ කලා මාධ්‍යය සමාජයකට සාරධර්ම සම්ප්‍රේෂණය කිරීමෙහිලා මූලික වූ ප්‍රබල සන්නිවේදන මාධ්‍යයක් බව පිළිගනී.<br>• උසස් රසඥතාවකට යොමුවෙයි.<br>• සදාචාරාත්මක පුරවැසියකු බිහිකරයි. | 24 |

## පාසල් ප්‍රතිපත්ති සහ වැඩ සටහන්

ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන අවධියේ ශිෂ්‍යයාට බුද්ධ ධර්මය විෂය පිළිබඳ අදාළ නිර්දේශ අනුව දැනුමක් ලබා දී ඇත. මූලික ධර්ම කරුණු සාමාජික, සංස්කෘතික හා දේශපාලන යන කරුණු ඔස්සේ වඩාත් පුළුල්ව අධ්‍යයනය කිරීමක් බෞද්ධ ශිෂ්ටාචාරය විෂයය යටතේ බලාපොරොත්තු වේ. එනිසා අ.පො.ස. (උ.පෙළ) සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කළ යුතු වේ.

බෞද්ධ අධ්‍යාපනයේ විෂය ක්ෂේත්‍රය ඉතා පුළුල් ය. ගැඹුරුය. බෞද්ධ ඉගැන්වීම්වල ජීවිතයේ ගැඹුරු ධර්ම කරුණු මෙන්ම සරල බාහිර පැත්තක් ද ආචාර විද්‍යාත්මක කරුණු ද ඇතුළත් ව පවතී. දත් දෙයින් නොදත් දෙයට යාම බෞද්ධ ඉගැන්වීම වන අතර නූතන අධ්‍යාපන විද්‍යාවේ ද එය පිළිගෙන ඇත. ගුරුභවතා මග කියන්නෙක් මෙන්ම අධීක්ෂකයෙක් ද වන අතර ශිෂ්‍යයාට ඉගෙනුම සඳහා පහසුකම් සලසන්නා ද වේ. බුදු දහමෙහි මෛත්‍රීය, කරුණාව, දයාව වැනි උසස් ආකල්ප වර්ධනය කිරීමටත්, බුද්ධි වර්ධනය, විමංශනය, තර්කනය, පරිකල්පන ශක්තීන් අවධාරණය කිරීමටත් සුදුසු පරිදි විෂය නිර්දේශය සකස් කර ඇත. ශිෂ්‍යයාගේ ආකල්ප වඩා වර්ධනය වීමට අවශ්‍ය පරිසරය ගුරුභවතා විසින් ලබා දිය යුතුය.

මෙහිදී මෙම විෂයය උගන්වන ගුරුභවතා බෞද්ධයකු වීම අනිවාර්ය විය යුතු අතර, ඔහු/ඇය විෂය විශේෂඥයකු වීම අවශ්‍ය වේ. එමෙන්ම ආගමික ප්‍රතිපත්ති සුරකින, ගරු කරන, ආගමික හැදියාවකින් යුක්ත අයකු වීම අත්‍යවශ්‍ය ය. විෂය ඉගැන්වීමේ දී සුදුසු පරිදි පන්ති වටපිටාව සකස් කර ගැනීමට ගුරුවරයාට මෙම කරුණු උපකාරවත් වේ.

බෞද්ධ ආගමික සංසදයක් ආරම්භ කොට ඒ මගින් ශිෂ්‍ය දක්ෂතා, හැකියා ඔප් නංවන්නට කටයුතු සැලසුම් කළ යුතුය. මේ මගින් බෞද්ධාගමික සාරධර්ම සම්බන්ධ වූ භාවනා, පිරිත්, ධර්ම සාකච්ඡා, ධර්ම දේශනා, දානමය පින්කම් සංවිධානය කිරීමට ගුරුභවතා විසින් ශිෂ්‍යයා යොමු කළ යුතුවේ. මෙම කරුණුවලට අමතරව බුද්ධි මණ්ඩල සාකච්ඡා, වාර ප්‍රකාශන, ක්ෂේත්‍ර චාරිකා, අධ්‍යාපන චාරිකා සැලසුම් කළ යුතු වේ.

මෙම අවස්ථාවලින් ලබන අත්දැකීම් ඔස්සේ ශිෂ්‍යයාගේ දැනුම, අකල්ප, කුසලතා වර්ධනයට සහ යහපත් ජීවන දර්ශනයක් ගොඩනැංවීමට අවශ්‍ය යහ පුරුදු ගොඩ නැගීමට හැකිවන සේ සැලසුම් සැකසිය යුතුය.

පාරිසරික සංරක්ෂණයට අදාළ වන ගෙවතු වගා, පාසල් භූමි අලංකරණය, ජල සංරක්ෂණය හා කළමනාකරණය, වන වගා ව්‍යාපෘති සඳහා ශිෂ්‍ය දායකත්වය ලබා ගත යුතුය. පරිසරය සුරක්ෂිත කිරීමේ ඇති වටිනාකම ශිෂ්‍යයන්ට ලබාදීමට මෙම වැඩ පිළිවෙල වැදගත් වේ. මෙම වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේ දී ශිෂ්‍ය කේන්ද්‍රීයව සැලසුම් සකස් කිරීම ගුරුභවතාගේ වගකීමකි. මෙහි දී බෞද්ධාගමික ඉගැන්වීම් ඉස්මතු වන පරිදි සැලසුම් කිරීමට නොකිරීම වැදගත් වේ. පාසල පදනම් කරගත් ක්‍රියාවල දී සෑම අවස්ථාවක ම සටහන් තබා ගැනීමට ශිෂ්‍යයා යොමු කිරීම තුළින් වඩාත් ක්‍රමවත් ව නිරවුල් ව කටයුතු කිරීමේ අවස්ථාව සලස්වා දිය හැකිය. මෙම කරුණු සැකසීමේ දී වාර්ෂිකව සැලසුමක් ඔස්සේ ක්‍රියාත්මක කිරීම වඩාත් ඵලදායක වනු ඇත.

වසර දහතුනක් තිස්සේ ලත් ආගමික අධ්‍යාපනය මත වැඩදායක පුරවැසියකු සමාජයට උරුම කිරීමට හැකි අයුරෙන් පාසල් ප්‍රතිපත්ති හා ඒ හා අදාළ වැඩ සටහන් සම්පාදනය වීම වැදගත් ය.

## තක්සේරුව හා ඇගයීම

- පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙල යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම්, ඇගයීම් හා උපකරණ, නිර්මාණාත්මක ව පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම අපේක්ෂිත ය.
- 13 වන ශ්‍රේණිය අවසානයේ දී ජාතික මට්ටමේ ඇගයීම වන අ.පො.ස. (උ.පෙළ) විභාගය සඳහා මෙම විෂය නිර්දේශය නිර්දේශිත ය.
- මෙම විෂය නිර්දේශය පදනම් කරගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාගය පළමු වරට 2019 වර්ෂයේ දී පැවැත්වේ.
- මෙම විභාගයේ ප්‍රශ්න පත්‍රවල ආකෘතිය හා ස්වභාවය පිළිබඳ අවශ්‍ය විස්තර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සැපයෙනු ඇත.

## විෂය නිර්දේශය සම්පාදක මණ්ඩලය

| | | |
|---|---|---|
| **අතිපූජ්‍ය ගන්තුනේ අස්සජි මහානායක මාහිමිපාණන් වහන්සේ** | - | හිටපු කථිකාචාර්ය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. |
| **මහාචාර්ය පූජ්‍ය දේවාලේගම මේධානන්ද හිමි** | - | හිටපු මහාචාර්ය, කැලණිය විශ්වවිද්‍යාලය. |
| **මහාචාර්ය පූජ්‍ය තැරැලේ ධම්මරතන හිමි** | - | මහාචාර්ය, කැලණිය විශ්වවිද්‍යාලය. |
| **පූජ්‍ය උඩුගම සුදස්සී හිමි** | - | දෙපාර්තමේන්තු ප්‍රධාන, ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| **මහාචාර්ය උදිත ගරුසිංහ මහතා** | - | මහාචාර්ය, කැලණිය විශ්වවිද්‍යාලය. |
| **ආචාර්ය කේ.ඒ. විරසේන මහතා** | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. |
| **ආර්.ඒ. ගුණවර්ධන මහතා** | - | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, ගිරිඋල්ල. |
| **ජී.ආර්.එම්.ඒ. ගම්ලත් මහතා** | - | ගුරු සේවය, ධර්මපාල මහා විද්‍යාලය, ඇරැව්වල, පන්නිපිටිය. |
| **ඒ. ඩබ්ලිව්. එම්. අනුරා වීරසූරිය මහත්මිය** | - | ගුරු සේවය, කො/ ගෝතමී බාලිකා විද්‍යාලය, කොළඹ 10. |